# රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
# அரச நிதித் திணைக்களம்
# DEPARTMENT OF PUBLIC FINANCE

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General — Tel. 94-11-2484614, Fax. 94-11-2431458

කාර්යාලය / அலுவலகம் / Office — Tel. 94-11-2484637, Fax. 94-11-2431458

பொதுத் திறைசேரி, நிதி அமைச்சு, கொழும்பு-01, இலங்கை.

මහා භාණ්ඩාගාරය, මුදල් අමාත්‍යාංශය, කොළඹ-01, ශ්‍රී ලංකාව.

General Treasury, Ministry of Finance, Colombo-01, Sri Lanka.

Website: www.pfd.gov.lk    E-mail: info@pfd.treasury.gov.lk


මගේ අංකය / எனது இல / My No } PFD/ADM/INS/2019 - 01    ඔබේ අංකය / உமது இல / Your No }    දිනය / திகதி / Date } 2019.06. 21

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්,
රාජ්‍ය ව්‍යාපාර හා ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,

**<u>රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව මගින් ඉටුකරනු ලබන රාජකාරි ලිපි ගණුදෙනු සඳහා විද්‍යුත් සන්නිවේදනය භාවිතා කිරීම.</u>**

රාජ්‍ය අංශයේ සේවා සැපයීම කාර්යක්ෂම කිරීම සඳහා ඉලෙක්ට්‍රොනික සන්නිවේදන (විද්‍යුත් තැපැල , විද්‍යුත් ලිපි හා ලේඛන) භාවිතා කිරීම සම්බන්ධයෙන් නිකුත් කරන ලද ජනාධිපති ලේකම්ගේ SP/SB/01/13 හා 2013.10.09 දිනැති ලිපියට අනුව, ඉලෙක්ට්‍රොනික සන්නිවේදනය පිළිබඳ 2006 අංක 19 දරණ පනතින් සහ ශ්‍රී ලංකා තාක්ෂණ නියෝජිතායතනය විසින් නිකුත් කරන ලද ධවල පත්‍රිකාවෙන් ඉලෙක්ට්‍රොනික ලිපි ලේඛන භාවිතය මගින් අත්වන වාසි සවිස්තරාත්මකව පැහැදිලි කර ඇතත්, රාජ්‍ය අංශයේ කාර්යක්ෂමතාවය සඳහා එකී මාධ්‍ය භාවිතය අවම මට්ටමක පවතින බව එම ලිපිය මගින් පෙන්වා දී ඇත.

02. ඒ අනුව මුදල් රෙගුලාසි, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා ඊට සමගාමීව වරින් වර නිකුත් කරනු ලබන රාජ්‍ය මුදල් චක්‍රලේඛ හා අතිරේකයන්ට (Supplements) අනුකූලව අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු /රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතන විසින් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන වාර්තා/ ලිපි ලේඛන සම්බන්ධයෙන් 2019.07.01 දින සිට පහත උපදෙස් පරිදි කටයුතු කරන ලෙස කාරුණිකව දැනුම් දෙමි.

**i.** මුදල් රෙගුලාසි/ රාජ්‍ය මුදල් චක්‍රලේඛ අනුව, **විගණකාධිපති/ පාර්ලිමේන්තුව හා මුදල් අමාත්‍යාංශයේ වෙනත් අදාළ දෙපාර්තමේන්තු වෙත ඉදිරිපත් කළයුතු පහත සඳහන් වාර්තා එකී ආයතන වෙත ඉදිරිපත් කළ බවට අදාල ආවරණ ලිපිය මෙම දෙපාර්තමේන්තුව වෙත විද්‍යුත් තැපෑලෙන් යොමු කිරීම පමණක් ප්‍රමාණවත් වේ. (අදාල වාර්තාවේ මෘදු පිටපත (Soft Copy) එකී ලිපියට ඇමුණුම් ලෙස එක් කිරීම අවශ්‍ය නොවන අතර හැකි සෑම විටම එකී වාර්තා ඔබ ආයතනයේ වෙබ් අඩවියෙහි උඩුගත කිරීමට (Upload) කටයුතු කිරීම යෝග්‍ය වේ.)**

| වාර්තාව | මුදල් රෙගුලාසි/රා.මු.ච අනුව යොමු කළ යුතු ආයතනය |
|---|---|
| වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා | රා.මු.ච 05/2016 (2016.03.31)<br>රා.මු.ච 422 (2006.07.30) } විගණකාධිපති වෙත |
| කාර්ය සාධන හා වාර්ෂික වාර්තා | රා.මු.ච 402 (2002.09.12) - පාර්ලිමේන්තුව/ විගණකාධිපති/ ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත |
| සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරි සැලැස්ම | 01/2014 (2014.02.17) - විගණකාධිපති වෙත |
| වාර්ෂික ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම (Master Procurement Plan) හා ප්‍රසම්පාදන කාල සටහන (Procurement Time Schedule) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4/II අනුව - ප්‍රසම්පාදන අධීක්ෂණ ඒකකය (Procurement Monitoring Unit )<br>රා.මු.ච 5/2018 (2018.10.23) සහ රා.මු.ච ලිපි අංක 5 (2018.11.16) } විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන ලේකම් කාර්යාලයෙහි (e-GP Secretariat) පහත සඳහන් විද්‍යුත් ලිපිනයට යොමු කිරීම **<u>promise@ pfd.treasury.gov.lk</u>** |

**ii.** මුදල් රෙගුලාසි රාජ්‍ය මුදල් චක්‍රලේඛවලට අනුව **රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව** වෙත යොමු කළ යුතු පහත සඳහන් වාර්තා හා ලිපිලේඛන ආවරණ ලිපි සහිතව පරිලෝකනය (Scan) කර නියමිත දිනට පෙර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ විද්‍යුත් තැපැලට (dgdocs@pfd.treasury.gov.lk) පමණක් යොමු කිරීම ප්‍රමාණවත් වේ.

| **වාර්තාව** | **මුදල් රෙගුලාසි / රා.මු.ච** |
|---|---|
| විගණකාධිපති වාර්තා හා විගණන විමසුම් | මු.රෙ. 124 (මුදල් කටයුතු අධීක්ෂණය)<br>මු.රෙ.126 (භාණ්ඩාගාර අධීක්ෂණ හා පාලනය යටතේ) |
| COPA හා COPE කමිටු මඟින් කරනු ලබන කැඳවීම්වලට අනුව විගණකාධිපති වාර්තා සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන පැහැදිලි කිරීම්වල: **<u>භාෂා ත්‍රිත්වයෙන් එක් පිටපතක් බැගින් පමණක් යොමු කිරීම.</u>** | මු.රෙ. 124 (මුදල් කටයුතු අධීක්ෂණය)<br>මු.රෙ.126 (භාණ්ඩාගාර අධීක්ෂණ හා පාලනය යටතේ) |
| අරමුදල් සම්බන්ධ මූල්‍ය වාර්තා / අයවැය ලේඛන | රා.මු.ච. 423 (2006.12.22) |

03. ඉහත 2(i) හා (ii) උපදෙස්වලට අනුකූලව කටයුතු කිරීම මඟින් මුද්‍රිත මාධ්‍ය සන්නිවේදන කටයුතු සඳහා දරනු ලබන පිරිවැය (මුද්‍රණ/ඡායා පිටපත්/ තැපැල් ගාස්තු / ලේඛනාගාර පහසුකම්) අවම කර ගැනීමටත්, රාජකාරී කටයුතු මනා කාර්යක්ෂමතාවයකින් හා ඵලදායීතාවයකින් ඉටු කරගැනීමටත්, කඩදාසි රහිත (Paperless) ප්‍රියමනාප කාර්යාල පරිශ්‍රයක් මෙම දෙපාර්තමේන්තුව තුල ස්ථාපිත කිරීමටත්, අපේක්ෂා කරන අතර මෙම ක්‍රියාදාමය සාර්ථක කරගැනීමට ඔබ ලබාදෙන සහයෝගය ඉතා අගය කොට සලකමි. ඔබ ආයතනය විසින් දැනට මුද්‍රිත වාර්තා යැවිය යුතු සෙසු ආයතන සමඟ සාකච්ඡා කොට, ඉදිරියේදී මුද්‍රිත වාර්තා වෙනුවට විද්‍යුත් වාර්තා යැවීමට කටයුතු කිරීම කාලෝචිත බවද වැඩිදුරටත් දන්වා සිටිමි.

පී.අල්ගම
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්- 01.ලේකම්,ජනාධිපති ලේකම් කාර්යාලය
02.විගණකාධිපති,විගණකාධිපති දෙපාර්තමේන්තුව